# වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය

# ඇල්කඩුව වැවිලි සමාගම

# ඇබෑර්තු

## ඇල්කඩුව වැවිලි සමාගමේ පවත්නා පහත සඳහන් ඇබෑර්තු පිරවීම සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

**තනතුර - සාමාන්‍යාධිකාරී (ස්ථිර)**

සුදුසුකම් – බාහිර අයදුම්කරුවන්

01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක් වෙතින් ලබාගත් ප්‍රථම උපාධිය සහ කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි සුදුසුකම (මාස්ටර්ස්) හෝ කළමනාකරණය පිළිබඳ පිළිගත් වෘත්තීය ආයතනයක ආයතනික සාමාජිකත්වය සමග සනාථ කළ හැකි වාර්තාවක් සමග රාජ්‍ය හෝ පුද්ගලික අංශයේ ආයතනයක, ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් පසු ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ අවුරුදු 05ක් ඇතුළත්ව කළමනාකරණ මට්ටමේ අවුරුදු 20ක පළපුරුද්ද.

- අභ්‍යන්තර

  ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කාණ්ඩයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී තනතුරක අවම වශයෙන් වසර 03 ක සතුටුදායක සේවය

  වැටුප් පරිමාණය – රු.161,140/-, 12 X 4850 = 219, 340/=

  (HM 2-1-2025) මාසිකව + රජයේ අනුමත දීමනා

  මූලික වැටුප් පියවර – රු. 119, 494/= (කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 හි උපලේඛනය ii ප්‍රකාරව)

  වයස් සීමාව – වයස අවුරුදු 40ට නොඅඩු විය යුතු අතර අවුරුදු 55 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා ඉහළ වයස් සීමාව අදාළ නොවේ.

**වෙනත් ප්‍රතිලාභ**

- නේවාසික සහ බාහිර වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය යටතේ පහසුකම්.
- සේවකයා විසින් තම වැටුපෙන්, සේවක අර්ථ සාධක අරමුදලට හෝ ලංකා වැවිලිකරුවන්ගේ අර්ථසාධක සමිතිය වෙත අවම වශයෙන් 10% ක දායකත්වයක් ලබාදිය යුතු අතර, ඇල්කඩුව වැවිලි සමාගම විසින්, ඒ සඳහා 12% ක දායකත්වයක් සමග 3% ක දායකත්වයක් සේවක භාර අරමුදලට ලබා දෙනු ඇත.
- නිලරථයක් සහ ඉන්ධන දීමනාව සැපයේ.
- සම්පූර්ණ ගෘහ භාණ්ඩ සහිත බංගලාවක් සැපයේ.

**තනතුර - වතු අධිකාරී (කොන්ත්‍රාත් පදනම මත)**

සුදුසුකම් – බාහිර අයදුම්කරුවන්

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් කෘෂිකර්මය පිළිබඳ ප්‍රථම උපාධිය

සමග

වැවිලි කර්මාන්ත ක්ෂේත්‍රයේ තේ,රබර්, පොල් හෝ අනෙකුත් මිශ්‍ර භෝග වැවිලි පිළිබඳ වසර 03ක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද.

වැවිලි කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමා සහතිකය, කෘෂිකර්මය පිළිබඳ ඩිප්ලෝමාවක් සහ තොරතුරු තාක්ෂණය පිළිබඳ ඉහළ දැනුමක් තිබීම අතිරේක සුදුසුකම් වේ.

- අභ්‍යන්තර

  ඇල්කඩුව වැවිලි සමාගමේ, කනිෂ්ඨ කළමනාකරණ කාණ්ඩයේ , 1 ශ්‍රේණියේ, සහකාර වතු අධිකාරී තනතුරක අවම වශයෙන් වසර 05ක සතුටුදායක සේවය.

  වැටුප් පරිමාණය – රු 121, 280/= (සියල්ල ඇතුළත්ව)

  වයස – වයස අවුරුදු 25 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා ඉහළ වයස් සීමාව අදාළ නොවේ.

**තනතුර - සහකාර වතු අධිකාරීවරු (කොන්ත්‍රාත් පදනම මත)**

සුදුසුකම් – බාහිර අයදුම්කරුවන්

01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්වවිද්‍යාලයකින් කෘෂිකර්මය පිළිබඳ ප්‍රථම උපාධිය

    සහ

02. තේ ,රබර්, පොල් සහ මිශ්‍ර භෝග වැවිලි ක්ෂේත්‍රයේ අධීක්ෂණ ධාරිතාවයෙන් වසර 01 ක පළපුරුද්ද.

- අභ්‍යන්තර

තේ,රබර්, පොල් සහ අනෙකුත් මිශ්‍ර භෝග වැවිලි ක්ෂේත්‍රයේ 1ශ්‍රේණියේ කළමනාකාර සහකාර කාණ්ඩයේ තනතුරක අවම අවුරුදු 05 ක පළපුරුද්ද.

වැටුප – රු. 80, 165/= (සියල්ල ඇතුළත්ව)

වයස – වයස අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**බඳවා ගැනීමේ ක්‍රමවේදය**

පත්කිරීමේ බලධාරීන් විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහමය සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත සිදු කෙරේ.

ව්‍යුහමය සම්මුඛ පරීක්ෂණය

| | |
|---|---|
| • අදාළ අමතර පළපුරුද්ද | ලකුණු 30 |
| • අදාළ අමතර සුදුසුකම් | ලකුණු 30 |
| • වෙනත් ලද ජයග්‍රහණ | ලකුණු 15 |
| • සම්මුඛ පරීක්ෂණයේදී ලබන කාර්ය සාධනය | ලකුණු 25 |
| | ලකුණු 100 |

වෙනත් – මෙම තනතුරුවලට සිදුකරනු ලබන සියලුම පත්කිරීම් අදාළ බඳවාගැනීමේ ක්‍රමවේදයේ විධිවිධාන වලට අනුගතව සිදු කෙරේ.
– සියලුම අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතුය.
– විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

අයදුම්පත් – අයදුම්කරුවන් විසින්, සියලුම විස්තර හා උප්පැන්න, අධ්‍යාපනික සහතිකවල හා පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත් සහිතව සකස් කළ අයදුම්පත් පහත සඳහන් ලිපිනය වෙත ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. අදාළ අයදුම්පත් බහාලූ කවරයේ ඉහළ වම් කෙළවරේ, අයදුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය. අයදුම්පත් භාරගැනීම අවසන් කරනු ලබන වේලාවෙන් පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ. අයදුම්පත් භාරගනු ලබන අවසන් දිනය – **2025 ඔක්තෝබර් 27 වන දින හෝ ඊට පෙර පහත සඳහන් ලිපිනය වෙත එවිය යුතුය.**

**සභාපති,**
**ඇල්කඩුව වැවිලි සමාගම,**
**රත්වත්ත, උකුවෙල.**
2025/10/15